# ලෝකයේ දුර්ලභ කරුණු හයක්
## 16.11.2019 - ශ්‍රී ලංකාරාමය
## නවසීලන්තය

හොඳයි, සැම දෙනාටම තෙරුවන් සරණයි! ශ්‍රද්ධාවන්ත පින්වත්නි, ආහාරපාන අරගෙන ඉවර උනාට පස්සේ මේ වෙලාවට අපි කරන්නේ ධර්ම සාකච්ඡාවක්. ඒ ධර්ම සාකච්ඡාවට අපි සූත්‍ර දේශනා කීපයක් දේශනා කරන්න හිතාගෙන ඉන්නවා. ඒ සූත්‍ර ධර්ම කීපය අපි බලමු මේ වෙලාවට කොච්චර දුරට එක්කාසු කරගන්න පුළුවන් වෙයිද කියලා. දැන් අපි ඒ සූත්‍ර ධර්ම සාකච්ඡා කරමු. අදත් මේ කියලා දෙන දේවල් සියල්ලක්ම මේ පින්වත් සැම දෙනාටම ඉතාමත්ම හොඳින් තේරුම් ගන්න වටහා ගන්න හැකිවේවා කියලා මෛත්‍රියෙන් ප්‍රාර්ථනා කරනවා. අපි නමස්කාරය කියලා පටන් ගනිමු.

<u>නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස</u>
<u>නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස</u>
<u>නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස</u>

මේ ධර්ම කරුණු පේළියකටයි තිබෙන්නේ. ඒවා පේළියකට මතක තියාගෙන ඉන්න එක හරි වටිනවා. එය මතක තියා ගැනීම නිසා සිහියත් වැඩෙනවා. ධර්මය ඇසුවා බවටත් පත්වෙනවා. ඒවගේම හොඳ මනසිකාර ගුණයකුත් තමන්ගේ හිත් තුල ඇතිවෙනවා. අපි පළමුවෙන්ම කියලා දෙන්න බලාපොරොත්තු වෙන මේ කරුණු ටිකෙන් තමාගේ ජීවිතිය සහ අනිත් අයට ලැබිලා තිබෙන ජීවිතවල තිබෙන ස්වභාවය පොඩ්ඩක් සංසන්දනය කරලා බලන්න. මාන්නයක් උපදවා ගන්නේ නැතුව පුණ්‍ය විපාකය ගැන හේතුව සලකන්න.

‘‘ඡන්නං, භික්ඛවෙ, පාතුභාවො දුල්ලභො ලොකස්මිං. කතමෙසං ඡන්නං? තථාගතස්ස අරහතො සම්මාසම්බුද්ධස්ස පාතුභාවො දුල්ලභො ලොකස්මිං, තථාගතප්පවෙදිතස්ස ධම්මවිනයස්ස දෙසෙතා පුග්ගලො දුල්ලභො ලොකස්මිං, අරියායතනෙ පච්චාජාති දුල්ලභා ලොකස්මිං, ඉන්ද්‍රියානං අවෙකල්ලතා දුල්ලභා ලොකස්මිං, අජළතා අනෙළමූගතා දුල්ලභා ලොකස්මිං, කුසලධම්මච්ඡන්දො දුල්ලභො ලොකස්මිං. ඉමෙසං ඛො, භික්ඛවෙ, ඡන්නං පාතුභාවො දුල්ලභො ලොකස්මි’’න්ති.

**‘‘ඡන්නං, භික්ඛවෙ, පාතුභාවො දුල්ලභො ලොකස්මිං** = බුදුරජාණන්වහන්සේ භික්ෂූන් වහන්සේලාට දේශනා කරනවා ‘‘මහණෙනි කාරණා 6 ක පහළ වීම ලෝකයේ දුර්ලභයි කියලා.

කාරණා හයක් දුර්ලභයි. දුර්ලභයි කියලා කියන්නේ හැම තැනම නෑ. නිතර නෑ. හැම රටකම හැම පළාතකම හැම ලෝකයකම නෑ.

**කතමෙසං ඡන්නං?** කවර සයෙක්ද යත්?

**1. තථාගතස්ස අරහතො සම්මාසම්බුද්ධස්ස පාතුභාවො දුල්ලභො ලොකස්මිං** = තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ කෙනෙකුගේ පහළ වීම ලෝකයේ දුර්ලභ කාරණයක්.

මේ දුර්ලභ කාරණය දැන් තිබෙනවා. ලොව්තුරා බුදුරජාණන්වහන්සේගේ පහළ වීම තිබෙනවා. අපි දැන් ජීවත් වෙන්නේ බුද්ධ කාලයක, බුදු සමයක.

2. **තථාගතප්පවෙදිතස්ස ධම්මවිනයස්ස දෙසෙතා පුග්ගලො දුල්ලභො ලොකස්මිං** = තථාගතයන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය විනය දේශනා කරන අය ලෝකයේ දුර්ලභයි.

මේක ඇත්තටම බොහෝම දුර්ලභ කාරණයක්. මේ ලෝකයේ බොහෝ දේශකයෝ ඉන්නවා. වෙනත් ආගම් සම්බන්ධයෙන් දේශනා කරන අය ඉන්නවා. විද්‍යාව ගැන සමාජය ගැන තාරකා ගැන මුහුද ගැන සත්තු ගැන ආදී මේ නොයෙකුත් මාතෘකා යටතේ දේශනා කරන ගොඩක් දේශකයෝ ඉන්නවා. නමුත් තථාගතයන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය දේශනා කරන අය දුර්ලභයි. ඒවගේම බෞද්ධ දේශනා ගත්තත් ඒවා බොහෝ විට ධර්මය නැති දේශනා පමණක් බව සාවධානව සවන් දෙන විට තේරුම් ගන්න පුළුවන්. සමහර වෙලාවට ධර්ම දේශනා තිබෙනවා නමුත් ඒවා අහන අය නෑ. ඒක නිසා බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා ලොව්තුරා බුදුරජාණන්වහන්සේ විසින් දේශනා කරන ලද, බුද්ධ දේශනාවේ තිබෙන සාරය වන චතුරාර්ය සත්‍ය ධර්මය, හේතු-ඵල ධර්මය, පටිච්චසමුප්පාදය, ඉන්ද්‍රිය, ආයතන, ස්කන්ධ, ධාතු, කර්මය, කර්මඵලය ආදී දේවල් දේශනා කරන අය අඩුයි කියලා.

අනිත් එක තමයි ජාති ජරා මරණ. ඇත්තටම කියනවා නම් යම්කිසි කෙනෙකුට ධර්මයක් කියලා දෙන්නේ රූපයේ තව තව ඇලෙන්න නොවෙයි, බුදුරජාණන්වහන්සේ ධර්මය දේශනා කරන්නේ රූපයේ කළකිරෙන්නයි. ඇත්තටම මනුස්සයෝ තමන්ට තිබෙන වේදනාවේ ඇලෙනවා. තව තව වේදනාවේ අලවන්න, තව තව වේදනාව පතවන්න, තව තව වේදනාව දික් ගස්සා ගන්න නොවෙයි බණ කියන්න ඕනෑ වෙන්නේ, වේදනාවේ තිබෙන භයානකත්වය කියලා දීලා වේදනාවේ කළකිරෙන්නයි බණ කියන්න ඕනෑ. ඒවගේම සංඥාවේ ඇලෙන්නේ නැතුව සංඥාවේ කළකිරෙන්න බණ කියන්න ඕනෑ. සංස්කාරයන් කෙරෙහි ඇලෙන්නේ නැතුව බැඳෙන්නේ නැතුව පතන්නේ නැතුව සංස්කාරයන් කෙරෙහි කළකිරෙන්න බණ කියන්න ඕනෑ. විඤ්ඤාණයේ ඇලෙන්නේ නැතුව කළකිරෙන්න බණ කියන්න ඕනෑ. ඒක නිසා රූප - වේදනා - සංඥා - සංඛාර - විඤ්ඤාණ කෙටියෙන් කියතොත් නාම රූප ධර්ම කෙරෙහි ඇලෙන්නේ නැතුව බැඳෙන්නේ නැතුව පතන්නේ නැතුව එහි කළකිරෙන්න බණ කියන්න ඕනෑ. එහෙම බණ කියන එක තමයි තථාගතයන් වහන්සේගේ නියම ධර්ම දේශනාව. එතකොට තමයි සසර දුකින් මිදී යන්නේ.

3. **අරියායතනෙ පච්චාජාති දුල්ලභා ලොකස්මිං** = ආර්යන්වහන්සේලා පහළ වෙන ස්ථානයක ඉපදීම දුර්ලභයි. (මේකේ එක අදහසක් තිබෙනවා ලොව්තුරා බුදුරජාණන්වහන්සේ පහළ වෙච්ච මධ්‍යම දේශයේ පහළ වීම දුර්ලභයි කියලා. අනිත් අදහස තමයි විශේෂයෙන්ම ලොව්තුරා බුදුරජාණන්වහන්සේගේ ධර්මය තිබෙන තැනක ඉපදීම දුර්ලභයි කියන එක)

ඒ කියන්නේ වෙන වෙන තැන්වල ඉපදෙන්න පුළුවන්, නමුත් බුදුරජාණන් වහන්සේගේ ධර්මය පවතින පවුලක, රටක, දේශයක පහළ වීම දුර්ලභයි. හේතුව, උන්වහන්සේගේ ධර්මය ක්‍රියාත්මකවන උන්වහන්සේගේ ධර්මය අහන්න ලැබෙන පළාතක ගමක රටක දේශකය පවුලක ඉපදුනහම පුංචි කාලේ ඉඳලාම අහන්න ලැබෙන්නේ මෛත්‍රිය කරුණාව දයාව සහ බුදුරජාණන්වහන්සේගේ ධර්ම කාරණා සහ ඒ පැවැත්ම ඇතුළු දේවල්. එතකොට ශ්‍රද්ධාව ජනිත වෙනවා, ශ්‍රද්ධාව බෝ වෙනවා, ශ්‍රද්ධාව වැඩි වෙනවා. මධ්‍යම දේශයේ උපදින එක තමයි සමහර තැන්වල අර්ථ ගන්වලා තිබෙන්නේ. නමුත් ධර්මය තිබෙන තැනක ඉපදෙන්න ඕනෑ. අද මධ්‍යම දේශයට ගියොත් අද මධ්‍යම දේශයේ තිබෙන්නේ වෙන දෙයක්. ඒක නිසා මේ කාරණය මේ විදියට තේරුම් ගන්න ඕනෑ. මේ නිසා තථාගතයන් වහන්සේගේ ධර්මය තිබෙන තැනක පහළ වීම දුර්වලයි.

4. **ඉන්ද්‍රියානං අවෙකල්ලතා දුල්ලභා ලොකස්මිං** = ඉන්ද්‍රිය විකලත්වයක් නැතුව උපදිනවා කියන එක දුර්වලයි.

සමහරුන්ට ඇස් පේන්නේ නෑ. සමහරුන්ට කන් ඇහෙන්නේ නෑ. ඒවගේම යන්න එන්න බෑ. අතපය කොරවෙලා. ආන්න ඒවගේ අංග විකලතාවයක් නැතුව ස්වාදීනව තමන්ගේ කටයුතු කරගන්න පුළුවන් වෙන විදියට නිරෝගීව අංග විකලත්වක් නැතුව උපදින්න ලැබෙනවා කියන එක දුර්ලභයි. මේ පින්වතුන්ගේ ජීවිත වල මේ කාරණය හමුවෙලා තිබෙනවාද කියලා හොඳට හිතලා බලන්න.

සමහර කෙනෙකුගේ ඇස් පේන්නේ නැත්නම් වෙනත් කෙනෙකු මත පිහිටන්න ඕනෑ තමන්ගේ එදිනෙදා කටයුතු කරගන්න. ඉන්ද්‍රිය විකලත්වයක් තිබෙනවා කියලා කියන්නේ ඒක අහේතුක ජීවිතියක් බවට පත් වෙනවා. එයා අහේතුකතත්වයෙන් උපදින්නේ. එහෙම ඉන්ද්‍රිය විකල භාවයක් නැතුව හොඳට ඉන්ද්‍රිය ධර්මයන් ඇතුව උපදිනවා කියලා කියන්නේ තමන්ට ස්වාදීනව කටයුතු කරගන්න පුළුවන්, හිතන්න පුළුවන් චින්තනයක් නුවණක් තිබෙන්නා වූ පිරිසක් බවට පත්වෙනවා.

5. **අජළතා අනෙළමූගතා දුල්ලභා ලොකස්මිං** = කෙලතොලු නොවී මන්දබුද්ධික නොවී උපදිනවා කියන එක දුර්ලභයි.

සමහර අය ඉන්නවා කටින් කෙළ වැක්කෙරෙනවා නමුත් එය පිහිදාගන්න තේරෙන්නේ නෑ. කල්පනාවක් නෑ. ඒවගේ නුවණක් කල්පනාවක් සිහියක් නැති, යන්නේ කොහෙද ඉන්නේ කොහෙද කියලා තේරෙන්නේ නැති ජීවිත තිබෙනවා. ඒ අයට බුදුරජාණන් වහන්සේගේ ගැඹුරු ධර්මය තේරෙන්නේ නෑ. පැහැදිලි කරත් දුක්ඛය සමුදය නිරෝධය මාර්ගය තේරෙන්නේ නෑ. කර්මය කර්ම ඵලය තේරෙන්නේ නෑ. මෙලොව පරලොව තේරෙන්නේ නෑ. හොඳක් නරකක් තේරුම් ගන්න ආමාරුයි. කුසලයක් ධර්මයක් තේරුම් ගන්න අමාරුයි.

සමහර ගෙවල් වල මන්දබුද්ධික ළමයි ඉන්නවා. ඒ අය බුද්ධ පූජාව ගෙනිහිල්ලා තියනවා. අත ගහන්න කිව්වහම අත ගහනවා. තේරිලා කරනවා නොවෙයි. අනිත් අය කරනවා බලාගෙන සංඥාවෙන් කරනවා.

එහෙම මන්ද බුද්ධික නැති ජීවිත ලබනවා කියන එකත් ලේසියෙන් ලැබෙන දෙයක් නොවෙයි. ඒක හරි දුර්ලභ කාරණයක්. යමක් අපිට තිබෙනවා නම් ඒකේ වටිනාකම අපිට දැනෙන්නේ නෑ. ඒ වටිනාකම් දැනෙන්න නම් පොඩ්ඩක් මේ ගැන හිතලා 'මේ ලෝකයේ තිබෙන දේවල් මටත් තිබෙනවාද, මේ දේවල් මගේ ජීවිතියේ හමුවෙනවද කියලා හොඳට හිතලා බලන්න ඕනෑ.

6. **කුසලධම්මච්ඡන්දො දුල්ලභො ලොකස්මිං** = ඉහත සඳහන් කාරණා සියල්ල තිබුණත් කුසලච්ඡන්දයක්, කුසල ධර්මයන් වඩන්න කැමැත්තක් ඕනෑකමක් පහළ කරගන්නවා කියන එකත් දුර්ලභයි.

දැන් බලන්න කොච්චර ජනගහනයක් ඉන්නවාද. මේවා සංසන්දනාත්මකව හිතලා බලන්න ඕනෑ. සමාන්‍යයෙන් හිතලා බලන්න. බණක් දේශනා කරනවා කියලා කිව්වාම කී දෙනෙක් එනවද? භාවනා වැඩ සටහනක් පවත්වනවා කියලා කිව්වහම කී දෙනෙක් එනවද, ඒවගේම නාට්‍යයක් තිබෙනවා කියලා කිව්වොත් කීදෙනෙක් එනවද, ක්‍රිකට් හරි නටන ගයන එකක් තිබෙනවා කියලා කිව්වොත් කී දෙනෙක් එනවාද, දන්සැලක් කිව්වොත් කීදෙනෙක් එනවද, භාවනාවක් කිව්වොත් කී දෙනෙක් එනවද කියලා සංසන්දනාත්මකව බලන්න. ඒ කියන්නේ කුසල ධර්මයට හිත නතුකරගන්න හිත නම්මවා ගන්න එක ලේසි දෙයක් නොවෙයි. කුසල ධර්මයට හිත නතුකරගන්න හිත නම්මවා ගන්න බැරිකම නිසා තමයි සත්වයෝ සසර දුකෙන් මිදී යන්නේ නැත්තේ. ඉතින් මේ කරුණු 6 තමන්ගේ ජීවිතියේ තිබෙනවාද කියලා කල්පනා කරලා බලන්න.

මේ ධර්ම කාරණා 6 ලෝකයේ දුර්ලභයි. ඒ ධර්ම කාරණා 6 ම අපේ ජීවිතියේ හමුඋනා කියන බව අපි හිතන්න ඕනෑ. ඒක නිසා මෙතැන ධර්ම වාසනාවක් ධර්ම ගුණයක් තිබෙනවා. මෙන්න මේ කරුණු හොඳට මෙනෙහි කරන්න. ජීවිතියේ sweep එකක් ඇදෙන එක නොවෙයි වටින්නේ. Sweep එකක් ඇදුන කෙනාටත් කැන්සර් එකක් හැදිලා තිබෙනවා. Sweep ඇදිච්ච මනුස්සයා ණය වෙලා බිමට වැටිලා තිබෙනවා. Sweep ඇදිච්ච මනුස්සයා පසුකාලීනව පොඩි ගෝනි කැල්ලක් දාගෙන බිම නිදාගත්තු ඒවත් තිබෙනවා. Sweep එකක් ඇදෙනවා කියන එකයි මේ ධර්ම කාරණා 6 තමන්ගේ ජීවිතියට ලබා ගන්නවා කියන එකයි දෙකක්. මේවා ඇත්ත වශයෙන්ම sweep එකක් ඇදෙනවා වගේ නොවෙයි. මේවා ජීවිතියේ මහා සම්පත්තිකර ධර්ම. වටිනාම සම්පත්තිකර ධර්ම. ඉතාම දුර්ලභ, රුවන් වලටත් වඩා වටිනා සම්පත්තිකර ධර්ම 6 අපේ ජීවිතියට ලැබුණා, අපි හිමිකර ගත්තා, ළං කර ගත්තා කියලා අපි හිතන්න ඕනෑ මෙනෙහි කරන්න ඕනෑ. ඒ වාසනාව අපිට තිබෙනවා.

මෙතැනදී කුසලච්ඡන්දය කියලා කියන්නේ සීල සමාධි ප්‍රඥා කියන චිත්ත ඒකාග්‍රතා හදාගන්න, අකුසලයෙන් දුරු වෙන්න, එක එක ක්‍රම වලින් බොජ්ඣංග ධර්ම වඩා ගන්න කැමැත්තක් - සතිපට්ඨාන ධර්ම වඩන්න කැමැත්තක් උපදවා ගන්න එකයි. මේක හරි ආමාරුයි. කුසල ධර්මයන් දියුණු කරන්න වඩන්න කැමැත්තක් තිබෙනවා නම් ඒකටයි කුසලච්ඡන්දය කියලා කියන්නේ.

මේ ධර්ම කාරණා ටික කෙනෙකුට තිබෙනවා නම්, කුසලච්ඡන්දයත් හදාගෙන බණත් අහගෙන ඒවගේම තේරුම් අරගෙන ඉන්ද්‍රිය විකලතාවයකුත් නැති නිසා මාර්ගය වඩාගෙන සෝවාන් මාර්ග ඵල උපදවා ගන්න පුළුවන්. සෝවාන් මාර්ග ඵල ලබාගන්න මේක basis එකක් ground එකක් වෙනවා. දැන් මේ ධර්ම ground එක තිබෙන නිසාවෙන් ධර්මය දියුණු කරගෙන සෝවාන් මගඵල අවබෝධ කරගන්න පුළුවන්.

ඊළඟට තිබෙනවා තවත් ධර්ම කාරණා ටිකක්.

''ඡයිමෙ, භික්ඛවෙ, ආනිසංසා සොතාපත්තිඵලසච්ඡිකිරියාය. කතමෙ ඡ? සද්ධම්මනියතො හොති, අපරිහානධම්මො හොති, පරියන්තකතස්ස දුක්ඛං න හොති, අසාධාරණෙන ඤාණෙන සමන්නාගතො හොති, හෙතු චස්ස සුදිට්ඨො, හෙතුසමුප්පන්නා ච ධම්මා. ඉමෙ ඛො, භික්ඛවෙ, ඡ ආනිසංසා සොතාපත්තිඵලසච්ඡිකිරියායා''ති.

**''ඡයිමෙ, භික්ඛවෙ, ආනිසංසා සොතාපත්තිඵලසච්ඡිකිරියාය** = සෝවාන් මාර්ග ඵල ධර්ම අවබෝධකර ගැනිමේදී ආනිසංස ධර්ම 6 ලැබෙනවා.

1) **සද්ධම්මනියතො හොති** = සද්ධම්මනියතො හොති කියලා කියන්නේ අනිවාර්යෙන්ම එතැනින් එහාට එයා සකෘදාගාමී වෙනවා, අනාගාමී වෙනවා, රහත් වෙනවාමයි. සකෘදාගාමි අනාගාමී අරහත් වෙලා අනිවාර්යෙන්ම එයා සසර දුකින් මිදිලා නිවන් අවබෝධ කර ගන්නවාමයි. මේකට කියනවා **සද්ධම්ම නියතතාවය** කියලා. කෙනෙක් සෝවාන් උනාට පස්සේ එතැනින් එහාට දියුණු වෙලා යනවා. ඒක අනිවාර්යයි.

2) **අපරිහානධම්මො හොති** = අපරිහානධම්මො හොති කියලා කියන්නේ කවදාකවත් එතැනින් පහළට වැටෙන්නේ නෑ කියන එක. සෝවාන් වෙච්ච එක්කෙනා ඉස්සරහට යනබවට සහතිකයි. නමුත් කවදාකවත් නැවත පිරිහෙන්නේ නෑ, පෘථජ්ජනයෙක් බවට පත්වෙන්නේ නෑ.

යම්කිසි කෙනෙක් සෝවාන් මාර්ග ඵල ධර්මයන් අවබෝධ කරගන්නේ ධර්ම 3 දැන ගෙනයි.

එයා අනිත්‍යත්වය තේරුම් ගත්තා. සංස්කාර ධර්මයන්ගේ දුකක් තිබෙනවා කියලා ගැඹුරින් තේරුම් ගත්තා. සංස්කාර ධර්මයන් තුල ආත්මයක් නෑ කියලා තේරුම් ගත්තා. මේ කාරණා තුන තේරුම් අරගෙන තමයි සෝවාන් බවට පත්වෙන්නේ. කවදාකවත්ම එහෙම ප්‍රතික්ෂේප කරපු ධර්ම එනම් සංස්කාරයෝ අනිත්‍යයයි දුකයි අනාත්මයි කියලා අවබෝධ කරගත්ත එක්කෙනා කවදාකවත්ම කිසි කාලයක සංස්කාර ධර්මයෝ නිත්‍යයයි කියලා පිළිගැනීමට පත්වෙන්නේ නෑ. සංස්කාරයෝ තුල සැපයක් තිබෙනවා කියන කාරණය පිළිගන්නේ නෑ. සංස්කාරයෝ තුල ආත්මයක් ජීවයක් තිබෙනවා කියන කාරණය පිළිගන්න තත්වයට පත්වෙන්නේ නෑ. ඒක නිසා කියනවා අතහැරපු දේ අතහැරලාම ගියා, නැවත ඒ ධර්ම වලින් පහළට එන්නේ නෑ කියලා. **අපරිහානධම්මො හොති** කියලා කියන්නේ ඒකයි.

3) **පරියන්තකතස්ස දුක්ඛං න හොති** = පරියන්තකතස්ස දුක්ඛං න හොති කියලා කියන්නේ යම්කිසි විදියකින් අපි අත්හැරපු දුක් ටිකක් තිබෙවානම් ඒ දුක් ටික ආයේ කවදාකවත් එන්නේ නෑ.

යම්කිසි කෙනෙක් සෝවාන් වෙනකොට එයා අතහැරලා දාන දුක් ගොඩක් තිබෙනවා. ඒ තමයි නරකයේ උපදිනවා, නරකයේ ගිනිජාලා මැද තිබෙන ඒ දුක් කවදාකවත් නැවත එන්නේ නෑ. ඒ අත්හැරපු දුක් ටික ආයේ කවදාකවත් නැවත එන්නේ නෑ. තිරිසන් ලෝකයේ හරකුන් බැටළුවන් ඌරන් වෙලා ඒවගේ තවත් නොයෙක් සත්ව ජාතීන් වෙලා කැපෙන්න කෙටෙන්න සතුන්ට ගොදුරු වෙන්න ඉරාගෙන කන බවට පත්වෙන්න තිබෙන ඒ දුක්ඛ ස්කන්ධය නැවත එන්නේ නෑ. ප්‍රේත ලෝකයේ ඉපදිලා ප්‍රේතයෙක් හැටියට විඳින්න තිබෙන දුක්ඛ ස්කන්ධය ආයේ කවදාකවත් එයාට එන්නේ නෑ. ඒක නිසා මනුස්සලෝකයේ යම්කිසි කෙනෙක් යම්කිසි දුකක් විඳිනවාද ඒ තත්වයට පත්වෙන්නේ නෑ. සමහර අය මනුස්සලෝකයේ ඉපදුනත් කෙලතොලු වෙනවා, අන්ධ බධිරයෝ වෙනවා, ඒවාගේම නොයෙක් ආකාරයේ පීඩා සහගත දුක් සහගත අයවලුන් බවට පත්වෙනවා. සෝවාන් මාර්ග ඵල ලබාගත්ත කෙනෙක් කවදාකවත් ඒ වගේ අඳ ගොළු බිහිරි තත්වයන්ට පත්වෙන්නේ නෑ. ඒකට කියනවා **පරියන්තකතස්ස දුක්ඛං න හොති** කියලා. ඒ අයින් කරපු දුක්ටික අයින් කරාමයි. ඒක සුළුපටු දෙයක් නොවෙයි.

අපි හැම කෙනාගේම හිත්වල මේ සැකය තිබෙනවා. අපි අපාය දුකට යයිද තිරිසන් ලෝකයට යයිද ප්‍රේත ලෝකයට යයිද කියලා සැකයක් තිබෙනවා. ඊළඟට මනුස්සලෝකයේ කොහේ හරි තැනක උපදියිද කියලා එහෙම සැකයක් තිබෙනවා. හිතලා බලන්න අපි කවුරුත් කැමති නෑ මැරිලා ගිහිල්ලා සෝමාලියාව වගේ පැත්තක ඉපදෙන්න. එහෙ දුක් වැඩියි, ධර්මය නෑ. විපත් නෑ. සැක සංකා වැඩියි. කන්න බොන්න නෑ. ආන්න ඒ වගේ මහා විසාල දුක් කන්දරාවක් තිබෙනවා. සෝවාන් වූ කෙනාට මේ කිසිවක් නෑ.

4) **අසාධාරණෙන ඤාණෙන සමන්නාගතො හොති** = අසාධාරණ ඤාණයෙන් සමන්නාගත වෙනවා කියලා කියන්නේ සාමාන්‍ය මනුස්සයෙක් හිතන විදියට නොවෙයි මෙයා හිතන්නේ. ඒකට කියනවා අසාධාරණ ඤාණ ස්වභාවය කියලා. සමාන්‍යයෙන් මිනිස්සු හිතන්නේ මෙනෙහි කරන්නේ මේ ලෝකයේ ඇත්තක් නිත්‍යයක් හොඳක් ඒවාගේම සදාකාලික සැපයක් නිත්‍යය ස්වභාවයක් තිබෙනවා කියලා. පුහුදුන් ලෝකයා ඒ විදියට තමයි හිතෙන්නේ. පෘථජ්ජනයාට මේ ලෝකය විසාල මල් උයනක්. දැන් අපි හිතමු, අපි මළ ගේකට ගියහම මැරිච්ච එක්කෙනා පිළිබඳව ගුණ කථනයක් කරලා ඒ මැරිච්ච එක්කෙනාගේ දේහය දිහා බලලා හිතලා ඒක තමන්ගේ ජීවිතියට ආරෝපණය කරලා දුකක්

හඳාගත්තත් කණගාටු උනත් තේ එකක් බීපු ගමන් අපිට ඒක අමතක වෙනවා. ඒ තමයි පෘථජ්ජනයාගේ මානසික චින්තන ශක්තිය.

නමුත් සෝවාන් වෙච්ච එක්කෙනා එහෙම තේ එකකින් රවට්ටන්න පුළුවන් එක්කෙනෙක් නොවෙයි. එයාට තේරෙනවා ඒක බොරුවක්, ඒක මාරයාගේ උගුලක් කියලා. ඒ විදියට හිතන ගතිය පෘථජ්ජනයාට නෑ. ඒක නිසා මේ දේවල් අනිත්‍යයයි, මේ දේවල් දුකක්, මේකෙ අනාත්මයක් තිබෙන්නේ, මේක මායාවක්, මේක රැවටිල්ලක් කියන චින්තන ගතිය, කිසිම දෙයක් සදාකාලිකයි කියලා බාරගන්නේ නැති ගතිය තිබෙනවා සෝවාන් පුද්ගලයාට. ඒකට කියනවා **ආසාධාරණ ඤාණ** ස්වභාවය කියලා. එයාට ඇතිවීම නැතිවීම දකින උදයව්‍ය ඤාණය තිබෙනවා.

5) **හෙතු චස්ස සුදිට්ඨො** = යම්කිසි දෙයක් සිද්ධ වෙනවානම් ඒකෙ හේතුව දකින්න පුළුවන්කම තිබෙනවා සෝවාන් වූ කෙනාට.

6) **හෙතුසමුප්පන්නා ච ධම්මා** = සෝවාන් වූ කෙනාට හේතුවෙන් හටගත්ත ඵලය දකින්නත් පුළුවන්.

සෝවාන් වූ පුද්ගලයාට මෙන්න මේ ආනිසංස ධර්ම 6 විශේෂයෙන්ම ලැබෙනවා.

<u>ප්‍රශ්නය</u> - සංස්කාර ධර්මයන් අනිත්‍යයයි දුකයි අනාත්මයි කියන එක සෝවාන් ආර්යන් වහන්සේට සම්පූර්ණයෙන් අවබෝධ වෙනවාද?

<u>පිළිතුර</u> - සෝවාන් ආර්යන් වහන්සේට ඒ ධර්මතා තුනම සම්පූර්ණයෙන්ම අවබෝධ වෙනවා. සංස්කාර ධර්මයන්ගේ හැංගිලා තිබෙන ලක්‍ෂණ තුනක් තමයි අනිත්‍යත්ව ස්වභාවය - දුක්ඛ ස්වභාවය - අනාත්තම ස්වභාවය. හේතුවකින් හටගත්ත යම්කිසි දෙයක් මේ ලෝකයේ ඇත්ද ලොකුවට හෝ පොඩියට, රවුමට හෝ උසට, පාටට හෝ අපාටට ඒ සෑම දෙයක් අස්සෙම තිබෙනවා අනිත්‍ය characteristic එක - දුක්ඛ characteristic එක - අනාත්ම characteristic එක. මේ කියන්නා වූ ලක්‍ෂණ ධර්ම තුන තිබෙනවා. ඒක තේරුම් ගන්න අමාරුයි.

සෝවාන් වෙන්න යනකෙනාට විදර්ශනාවක් අවශ්‍යයි මේ ටික තේරුම් ගන්න. අමාරු එතැනට යන එකයි. ස්වාමීන්වහන්සේලා මේවා කියලා දෙනකොට, විස්තර කරනකොට අපේ හිත ඔය සංස්කාර ධර්ම අස්සට යන්තම් කිට්ටු වේවි 'අනිත්‍ය' 'දුක්ඛ' 'අනාත්ම' ස්වභාවයේ ගෑවෙන නොගෑවෙන තරම් ළඟට ගිහිල්ලා නැවත අනිත් පැත්තට එනවා. ඒක අවබෝධ කරන්න ඒ තරම්ම අමාරුයි. ඒ හරියටම ගිහිල්ලා හරියටම නුවණින් pinpoint වෙලා වදින්නේ නෑ. ඒ ළඟට යන්න ගිහිල්ලා අපහු එනවා. හේතුව, එහෙම ගිහිල්ලා හරියට ඒ ස්වභාවයන් දැක ගන්න තරම් ඉන්ද්‍රිය ධර්ම වල වැඩීමක් වෙලා නෑ. මේ අයට අද කියන මේ කථාව උනත් තේරෙන්නෙත් දැන් අවුරුදු ගානක ඉඳලා මේ කරගෙන යන වැඩ සටහන නිසා.

සෝවාන් වෙන එක්කෙනෙක් මේ අනිත්‍ය දුක්ඛ අනාත්ම කියන ලක්ෂණ තුනෙන් එකක් දැකලා සෝවාන් මාර්ග ඵල ලබාගන්නවා. අනිත්‍ය දැකපු කෙනා දුක සහ අනාත්මය දකිනවා එක්තරා ගානකට. නමුත් එයා නිවන් අවබෝධ කරගන්නේ අනිත්‍ය හරහා ගිහිල්ලා. සමහර කෙනෙක් නිවන් අවබෝධ කරගන්නවා දුක්ඛ මනසිකාරය වැඩියෙන් කරලා දුක තේරුම් ගැනීම තුලින්. සමහර කෙනෙක් අනාත්මය තේරුම් ගැනීම තුලින් සෝවාන් වෙනවා. මේ ලක්ෂණ තුනම වරින් වර දකිනවා, නමුත් මේ ලක්ෂණ තුනක් තිබුණාට නිවන් දකින වෙලාවට දොර ඇරෙන්නේ ඔය ලක්ෂණ තුනෙන් එකක. ඒක

නිසා තමයි විමොක්ෂ මුඛ තුනක් තිබෙනවා කියන්නේ. නමුත් සෝවාන් වෙන එක්කෙනා මේ ධර්මතා තුනම දකිනවා.

<u>ප්‍රශ්නය</u> - සෝවාන් පුද්ගලයා හැම වෙලේම අනිත්‍ය දකිමින්ම ඉන්නවාද?

<u>පිළිතුර</u> - සෝවාන් වෙච්ච එක්කෙනෙක් හැම වෙලාවේම අනිත්‍යයයි අනිත්‍යයයි කියා කියා ඉන්නේ නෑ. නමුත් එයාගේ සිතේ කාවැදිච්ච දෙයක් තිබෙනවා. එයා ලෝකය දකින්නේ අනිත් අය වගේ නොවෙයි. සෝවාන් පුද්ගලයාට හිතේ අනිත්‍යය සංඥාව කැවිලා තිබෙනවා. එයා සාමාන්‍යයෙන් අනිත් වැඩ කරනවා. ගේ අතුගානවා. ඉඳල ගන්නවා. Vacuum කරනවා. කන්න බොන්න හදනවා. ඒවගේ හැම දෙයක්ම කරනවා. ඒ මොනවා කරත් එයා ගත්ත ධර්ම සංඥාව විනාස වෙන්නේ නෑ.

<u>ප්‍රශ්නය</u> - සෝවාන් වූ කෙනෙකුට දුක දැනෙනවද?

<u>පිළිතුර</u> - දැනෙනවා

<u>ප්‍රශ්නය</u> - දුකෙන් කම්පා වෙන්න පුලුවන්ද?

<u>පිළිතුර</u> - කම්පා වෙනවා කියන එකයි දුක දැනෙනවා කියන එකයි දෙකක්. එයාට දුක දැනෙනවා, එයා ඒක තේරුම් ගන්නවා.

සෝවාන් වෙච්ච එක්කෙනා සෝවාන් වෙන්නේ එක්තරා area එකක ධර්ම අවබෝධයක් හින්දයි. සෝවාන් වෙන එක්කෙනාට සෝවාන් වෙන්න ධර්ම මෙනෙහි කරන්න ඕනෑ. ඒකට එයාට ධර්ම මණ්ඩලයක්, region එකක් ඕනෑ. ඒ region එක තමයි රූප - වේදනා - සංඥා - සංඛාර - විඤ්ඤාණ කියන පංච උපාදාන ස්කන්ධය. ඒ තමයි එයාගේ වපසරිය. ඒ තමයි එයාගේ භූමිය. ඒ තමයි එයා මෙනෙහි කරන්න බාර ගන්න ධර්ම කොට්ඨාසය. ඒ ටික තමයි එයා තේරුම් ගන්නේ. 'මේ ටික තමයි දුක, මේ තමයි අනිත්‍ය, මේ තමයි අනාත්මය, මේකේ රසයක් නෑ, හොඳක් නෑ, පීඩාවක්මයි තිබෙන්නේ' කියලා ජීවිතිය කියන එක එයා බාර අරගෙන තිබෙන්නේ දුක්ඛ පිණ්ඩයක් දුක්ඛ ස්කන්ධයක් හැටියට. ඉතින් එයා ඒ දුක්ඛ ස්කන්ධය තේරුම් ගත්ත වගේම තමයි අනිත් ඉන්නා වූ සියලුම දෙනාගේම ස්කන්ධත් තමන්ගේ වගේම දුක්ඛ ස්කන්ධ කියලා බාහිර දේකත් එයා සැපයක් දකින්නේ නෑ. ඒක දුකයි කියලා එයාගේ සිතේ තදින් කා වැදිලා තිබෙන්නේ. එහෙම එක්කෙනෙක් කොණ්ඩේ කඩා දාගෙන කම්පාවෙන ගතියක් ඇති කරගන්නේ නෑ. හැබැයි එයාට දුක දැනෙනවා. කෙනෙක් වියෝ උනහම ඒකත් දැනෙනවා. ඒක වෙන්නේ ඇලීම නිසා. සියල්ල වෙනස් වෙනවා කියලත් එයා දන්නවා නමුත් වෙන් වෙච්ච එක ගැන දුකකුත් එයාට තිබෙනවා. නමුත් එයා ඒ ජීවිතේ ස්ථිරයි කියලා බාර ගන්නේ නෑ. කම්පනය කියන එක වෙන එකක්.

<u>ප්‍රශ්නය</u> - විසාඛාව සෝවාන් වෙලත් ඇඬුවා නේද?

<u>පිළිතුර</u> - මෙහෙම එකක් තිබෙනවා. විසාඛාව කියන්නේ සිටු පවුලක කෙනෙක්. එයාට ගොඩක් සම්පත් තිබුණා. එයා බොහෝම හැඩ හරි ලස්සන කාන්තාවක්. ලෝකයාට පේනවා නම් එයාගේ හැඩ වැඩ ලස්සන එයාට දැනෙන්නේ නෑ කියන එක බොරු. ඒ ලස්සන තියෙන කොට එයාට ඇලීමක් හැදෙනවා. පිළිගැනීමක් හැදෙනවා. ඒක තිබෙනවා. ලස්සනට කැමැත්තක් තිබෙනවා කියලා දැනෙනවා. ඒක නිසයි මේල පළඳනාව එහෙම හදා ගත්තේ. එයා හොඳට රසට උයන්න කන්න බොන්න කැමති කෙනෙක්. එයා නිතරම විදර්ශනා භාවනාව කර කර හිටපු එක්කෙනෙක් නොවෙයි. ශ්‍රද්ධා මූලිකව

වැඩ කරපු කෙනෙක්. එයා සෝවාන් උනා, ශ්‍රද්ධාවෙන් භික්ෂූන් වහන්සේලාට, අසනීප වෙච්ච ස්වාමීන්වහන්සේලාට බොහෝම කරුණාවෙන් මෛත්‍රීයෙන් උදව් උපකාර කරපු හොඳ සල්ලිකාර කෙනෙක්.

තවත් සමහර අය ඉන්නවා පෘථජ්ජන උනත් සල්ලි නැති උනත් සෝවාන් වෙලා නැති උනත් විදර්ශනා භාවනාව කරලා විදර්ශනාව උපරිමයට තිබෙන. එයාට අනිත්‍ය පේනවා දුක පේනවා අනාත්මය පේනවා. එයා ජීවිතිය හොඳට මෙනෙහි කරගෙන යනවා. මෙයා විදර්ශනා කරලා ඒ විදර්ශනා භාවනාවේ තිබෙන බලයෙන් ශක්තියෙන් එයාට චූල සෝතාපන්න කියලා කියන්න පුළුවන්. එයා සංඛාරුපෙක්ඛා ඤාණ මට්ටමට ගිහිල්ල හැමදේම බලනවා. ‘මේවා මායාවල්, මේවා බොරු’ කියලා එයාට හොඳට තේරෙනවා. ඒක නිසා යම්කිසි මරණයක් විපතක් වෙච්ච අවස්ථාවකදී ඒ විදර්ශනා භාවනා බලය නිසා එයාට ඇඩීමක් වැලපීමක් වෙන්නේ නෑ. එහෙම වෙන්නේ එයා නිතර මනසිකාරය හසුරුවන නිසා. හැබැයි විදර්ශනා භාවනාව හේතුකරගෙන එයාට දුකක් ආවේ නැති උනාට එයා සම්පූර්ණයෙන් සතර අපායෙන් මිදිලා නෑ.

නමුත් සෝවාන් වෙච්ච එක්කෙනාගේ තිබෙන ස්වභාවය තමයි එයා නිතර භාවනා කරන්නේ නෑ. හැබැයි සෝවාන් මාර්ග ඵල වලට පත්වෙලා, ඒක නියතයි. කවදාකවත් එයා නරකයේ තිරිසන් ලෝකයේ ප්‍රේත අසුර කිසි තැනක උපදින්නේ නෑ. නමුත් එයා විදර්ශනා නොකරන හින්දාවෙන් ඇලීම ටිකක් වැඩිය තිබෙන හින්දාවෙන් යම් යම් අවස්ථාවල කඳුළු හලන්න සිද්ධ වෙනවා. ඕක ආනන්ද හාමුදුරුවන්ටත් තිබුණා. ඒක නිසා සෝවාන් උනා කියලම අඬන්නේ නෑ වැළපෙන්නේ නෑ කියලා කියන්න හොඳ නෑ.

මෙන්න මෙහෙම කාරණයක් තිබෙනවා. බෝධි සත්වයන්වහන්සේ, යසෝදරා දේවියට රාහුල කුමාරයා ඉපදිච්ච දවසේ රාජ මාලිගාවෙන් නික්මිලා වනාන්තර ගතවෙනවා. වනාන්තර ගතවෙලා උන්වහන්සේ අවුරුදු 6 බොහෝම දුක් විඳලා දුෂ්කරක්‍රියා පතිපදාවක යෙදිලා ධර්මය අවබෝධ කරගෙන ලොව්තුරා බුදු උනා. දැන් අවුරුදු 2500 කට පස්සේ කෙනෙක් ප්‍රශ්නයක් අහනවා. ඒ තමයි ‘තමන්ගේ ආදරණීය දරුවා බිහි වෙච්ච දවසේ ආදරණීය භාර්යාව අත්හැරලා දාල දරුවත් අතහැරලා දාලා යන පිය තුමා මොන කරුණාවක් තිබෙන එක්කෙනෙක්ද’ කියලා. දැන් ඒක මහා ලොකු ප්‍රශ්නයක්. මොන කරුණාවක්ද මොන දයාවක්ද මොකක්ද ඒ කළේ? කෝ කරුණාව කියලා අවුරුදු 2500 කට පස්සේ මේ ප්‍රශ්නය අහනවා.

එතකොට බෝධිසත්වයන් වහන්සේ එදා ගිහි ගෙයින් නික්මිලා කරුණාවයි මෛත්‍රීයයි ඇතිකරගෙන ලොව්තුරා බුදුබවට පත්වෙලා ධර්මය දේශනා කරලා පුතාත් රහත් කරලා භාර්යාවත් රහත්කරලා සංසාර දුකෙනුත් මිදිලා, තමන් වහන්සේත් චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ කරගෙන සසර දුකෙන් අපාය දුකෙන් මිදිලා නිවන් ගිහිල්ලා. භාර්යාවත් සංසාර දුකෙන් මිදිලා ලෝකයේ ප්‍රකට කාන්තාවක් බවට පත්වෙලා නිර්වාණයට පත්වෙලා. පුතනුවන් වහන්සේත් එනම් රාහුල ස්වාමීන්වහන්සේත් බණ අහලා අවුරුදු 20 දී රහත් වෙලා අපාය දුක නරකය තිරිසන් දුක ඔක්කොම නැති කරලා සංසාර දුක්ඛයන්ගෙන් සහමුලින්ම මිදිලා ගිහිල්ලා නිවන් දකලා.

එදා දරුවා හම්බවෙච්ච දවසේ ගිහි ගෙයින් නික්ම ගිය සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේත් භාර්යාවත් දරුවාත් කියන හැම දෙනාම සංසාර දුකෙන් මිදිලත් ගිහිල්ලා නමුත් ඒක තවමත් ප්‍රශ්නයක් වෙලා තිබෙන්නේ අවුරුදු 2500 කට පස්සේ මේ සංසාරයේ දුක් විඳින තවමත් අපායෙන් මිදිලා නැති නරකාදියට යන්නත් අවස්ථාව හොඳටම තිබෙන ප්‍රේත ලෝකයට යන්නත් අවස්ථාව හොඳටම තිබෙන කිසිම වැඩකට නැති වැඩ කරන මනුස්සයෙකුට. ඔක්කොම අය දුකින් මිදිලා ගිහිල්ලා. නමුත් ඒ දුකෙන් මිදෙන එක නොවෙයි තිබෙන්නේ, සමහර අය යෝනිසෝමනසිකාරය නැතුව

අයෝනිසෝමනසිකාරයෙන් කාරණයකට කොටු වෙලා පණ්ඩිත කමක් ආරෝපණය කරගෙන ප්‍රශ්නයක් හදාගෙන ඒ ප්‍රශ්නය එයාටම ප්‍රශ්නයක් කරගෙන ජීවත් වෙනවා. එහෙම අය ඉන්නවා.

හොඳට හිතලා බලන්න, එච්චර ඈතට යන්න හොඳ නෑ. ලංකාවේ පුංචි අවුරුදු දෙකේ තුනේ දරුවෝ ඉන්න අම්මලා රට අතහැරලා ගිහිල්ලා මැද පෙරදිග වෙනත් රටක වෙනත් ආගමක් ධර්මයක් නැති මිත්‍යා දෘෂ්ඨිකයන්ගේ ගෙවල් අස්සේ වළං පිඟන් හෝදන සුද්ධ පවිත්‍ර කරන තත්වයට පත්වෙලා ඉන්නවා. එතකොට ඇයි ඒ අම්මලා දරුවෝ නොපෙනන පැත්තකට ගියේ. සිද්ධාර්ථ කුමාරයා නම් ඒ රටේම වෙනත් පැත්තක කැලයකට ගියේ. දැන් මෙයා මුහුදෙනුත් එහා පැත්තට ගිහිල්ලා ඉන්නවා. සමහර වෙලාවට අම්මයි තාත්තයි දෙන්නම ගිහිල්ලා. ළමයින්ට අම්මත් නෑ තාත්තත් නෑ. මේ අය ගිහිල්ලා හරි හම්බකරගෙන අවුරුදු හය හතකට පස්සේ තමයි ආපහු ලංකාවට යන්නේ. ඒ අතර තුර සල්ලි මිල මුදල් යවනවා. මේ අය දරුවන්ගෙන් ඈත් වෙලා ඉන්නේ කුමක් නිසාද? දරුවන්ට තිබෙන ආදරයක් නිසා. ආදරය කියන්නේ දෙමව්පියෝ ළඟ ඉන්නවා කියන එකම නොවෙයි, ළඟ හිටියත් දුර හිටියත් පවුලට ඥාති වරයාට කොච්චර කරුණාවන්ත කැප කිරීමක් තියෙනවාද කියන එකයි. සමහර අම්මලා තාත්තලා වෙනත් රටවල් වලට ගිහිල්ලා ළමයි ලංකාවේ. නමුත් ප්‍රශ්න අහන අය ඒ ගැන කථා කරන්නේ නෑ. ඒ අයට ප්‍රශ්නය වෙලා තිබෙන්නේ සංසාර දුකෙන් මිදිලා ගිය බුදුරජාණන්වහන්සේ ගැන.

හොඳයි ඊළඟට තව කාරණා ටිකක් තිබෙනවා. ඒ තමයි සෝවාන් වීමට හේතුවන කාරණා.

'''සො වත, භික්ඛවෙ, භික්ඛු කඤ්චි සඞ්ඛාරං නිච්චතො සමනුපස්සන්තො අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො භවිස්සතී'ති නෙතං ඨානං විජ්ජති. 'අනුලොමිකාය ඛන්තියා අසමන්නාගතො සම්මත්තනියාමං ඔක්කමිස්සතී'ති නෙතං ඨානං විජ්ජති. 'සම්මත්තනියාමං අනොක්කමමානො සොතාපත්තිඵලං වා සකදාගාමිඵලං වා අනාගාමිඵලං වා අරහත්තං වා සච්ඡිකරිස්සතී'ති නෙතං ඨානං විජ්ජති.

**'''සො වත, භික්ඛවෙ, භික්ඛු කඤ්චි සඞ්ඛාරං නිච්චතො සමනුපස්සන්තො අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො භවිස්සතී'ති නෙතං ඨානං විජ්ජති** _

බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා 'මහණනි වෙන්නේ නැති දෙයක් තිබෙනවා' කියලා.

**නෙතං ඨානං විජ්ජති** = මේ කාරණය සිද්ධ වෙන්නේ නෑ.

මොකක්ද මේ සිදු නොවෙන කාරණය?

එක භික්ෂුන් වහන්සේ කෙනෙක් හිතනවා 'මේ සංස්කාර ධර්මයෝ නිත්‍යය වශයෙන් තිබෙනවා' කියලා. මේ භික්ෂුන් වහන්සේ සංස්කාර ධර්මයෝ අනිත්‍යයි කියලා බාර ගන්නේ නෑ. ඒවා නිත්‍යය වශයෙන් හිතනවා, නිත්‍යය වශයෙන් බාර ගන්නවා, නිත්‍යය වශයෙන් මෙනෙහි කරනවා. නිත්‍යය වශයෙන් බාර අරගෙන මෙනෙහි කරගෙන යනකොට ඒ භික්ෂුන් වහන්සේට **අනුලෝමික ක්ෂාන්තිය** කියන සෝවාන් මාර්ගයට සමාන විදර්ශනා අනුලෝමිකත්වයක් හැදෙනවා කියන එක වෙන්නේ නෑ.

**අනුලෝමික ක්‍ෂාන්තිය** කියලා එකක් තිබෙනවා. අනුලෝම ඥානය කියලා කියන්නේ විදර්ශනා ඥානයක්. ඒ විදර්ශනා ඥානය ලෝකෝත්තර ඥානයට සමානයි. ඒක ලෝකෝත්තර ඥානය ලබා දෙන මාර්ග අවස්ථාවක්. යම්කිසි භික්ෂුවක් මේ සංස්කාර ධර්මයෝ නිත්‍යය හැටියට පිළිගැනීම හේතු කාරණාවක් වීම නිසා මේ කියන්නා වූ අනුලෝමික ක්‍ෂාන්තිය හෙවත් මාර්ග ඥානය පහළ වෙනවා කියන එක කවදාකවත් වෙන්නේ **නෑ**. ඒ කියන්නේ, මේ ලෝකයේ සංස්කාර ධර්මයෝ නිත්‍යයයි සැපයි සදාකාලිකයි කියලා කෙනෙක් මෙනෙහි කරනවානම් එයාට කවදාකවත්ම විදර්ශනා පහළ වෙන්නේ නෑ. ඒවගේම විදර්ශනා ඥාන පහළ වෙන්නේ නැතුව යම්කිසි කෙනෙක් මාර්ග ඵල ලබනවා කියන එක කවදාකවත් වෙන්නේ නෑ කියලා කියනවා. ඒක නිසා හොඳට හිතේ තියාගන්න අනුලෝමික ඥානය තිබෙන්න ඕනෑ. අනුලෝමික ඥානය කියලා කියන්නේ විදර්ශනා නුවණේ උපරිමයක්. ඒ අනුලෝමික ඥාන අවස්ථාවේදී කිසිම කෙනෙක් සංස්කාර ධර්මයෝ ස්ථිර වශයෙන් පිළිගන්නේ නෑ. සැප වශයෙන් පිළිගන්නෙත් නෑ. විදර්ශනා ඥානය හමුකරගන්නේ නැතුව සම්මත්ත නියාමය කියන්නා වූ මාර්ග ස්වභාවයට පත්වෙනවා කියන එකත් කවදාකවත් වෙන්නේ නෑ.

**අනුලෝමික ක්‍ෂාන්තිය** සහ **සම්මත්ත නියාමය** යන වචන නිතර පාවිච්චි වෙන්නේ නැති නමුත් ධර්ම කියලා දෙන වචන.

1) **අනුලෝමික ක්‍ෂාන්තිය** = අනුලෝමික ක්‍ෂාන්තිය කියලා කියන්නේ විදර්ශනා නුවණේ උපරිමයක්. සංඛාර උපේක්ඛා ඥානයේ උපරියමටම ගියහම ඇති වෙන්නා වූ නුවණක්. ඒක සමානයි මාර්ග ඥාන වලට. ඒ මනසිකාරය පැවැත්වීම තුලින් තමයි මාර්ග ඥානය පහළ වෙන්නේ.

2) **සම්මත්ත නියාමය**

3) **සෝතාපත්ති ඵලය**

**අනුලෝමික ක්‍ෂාන්තිය** හෙවත් අනුලොමික ඥානයට ගොදුරුවෙන ධර්ම තිබෙනවා - **සම්මත්ත නියාමය** කියන ඒ මානසික ධර්මයට අරමුණු වෙන ධර්ම තිබෙනවා - **සෝවාන් ඵලයට** අරමුණු වෙන ධර්ම තිබෙනවා.

- **අනුලෝමික ක්‍ෂාන්තිය** කියන්නේ හිතේ පහළ වෙන ධර්ම ස්වභාවයක්. ඒක නුවණට කියන නමක්. එතකොට මේ අනුලෝමික ක්‍ෂාන්තිය කියලා කියන නුවණට අරමුණු වෙන්න දෙයක් තිබෙන්න ඕනෑ. මේ අනුලෝමික ක්‍ෂාන්තිය කියන නුවණට අරමුණු වෙන්නේ **සංස්කාරයෝ**.


- **සම්මත්ත නියාමය** කියලා කියන්නෙත් නුවණට කියන නමක්. මේ නුවණට අරමුණු වෙන්නේ සංස්කාරයෝ නොවෙයි, **නිර්වාණ ධාතුවයි**.

- **සෝතාපත්ති ඵලයට** අරමුණු වෙන්නෙත් **නිර්වාණ ධාතුවයි.**


**අනුලෝමික ක්‍ෂාන්තිය** කියන නුවණට අරමුණු වෙන්නේ සංඛත ධාතුවයි. **සම්මත්ත නියාමය** කියන නුවණට සහ **සෝතාපත්ති ඵලයට** අරමුණු වෙන්නේ අසංඛත ධාතුවයි.

අපි මෙහෙම හිතමු. කෙනෙක් විදර්ශනා කරගෙන යනවා. එයාගේ විදර්ශනාවට කරුණු තුනක් තිබෙනවා.

1) **අනුලෝමික ක්ෂාන්ති** අවස්ථාව. මේ කෙනා සංස්කාර ධර්ම වල **අනිත්‍ය - දුක්ඛය - අනාත්මය** සියුම්ව බලන අවස්ථාව.




2) අනුලෝම ඥානයෙන් සංස්කාරයන්ගේ අනිත්‍ය - දුක්ඛ - අනාත්ම බැලීමේ ප්‍රතිඵලයක් හැටියට මෙයා **සම්මත්ත නියාම** තත්වයට පත්වෙනවා. එතැනදී මෙයාට අනිත්‍ය නැති - දුකක් නැති - අනාත්ම නැති තැනක් පේනවා. එවිට එයා මාර්ගයෙන් **නිර්වාණ ධාතුව** දකිනවා.




3) ඊළඟට **සෝතාපත්ති ඵලයෙනුත්** දකින්නේ අසංඛත වූ **නිර්වාණ ධාතුවයි.**

විදර්ශනා ඥාන වලට පේන්නෙම සංස්කාර ධර්මයන්ගේ අනිත්‍යතා දුක්ඛතා අනාත්මතා සහ ඒවායේ තිබෙන භයානකත්වය ආදිය. ඒවා තමයි දැනෙන්නේ වැටහෙන්නේ පෙනෙන්නේ. දැන් මේ කියන්නා වූ අනුලොමික ක්ෂාන්තිය නැත්නම් ඒ කෙනා සම්මත්ත නියාම කියන තත්වයට පත්වෙනවා කියන එක වෙන්නේ නෑ. විදර්ශනාවක් නැතුව විදර්ශනා ඥානයක් පහළ කරගන්නේ නැතුව මාර්ග පහළ වෙන්නේ නෑ. මාර්ගයක් පහළ වෙන්නේ නැතුව සෝවාන් වෙන්නෙත් නෑ කියන එක මෙයින් කියනවා. ඒ අනුව එයා සකෘදාගාමී වෙන්නෙත් නෑ අනාගාමී වෙන්නෙත් නෑ අරහත් වෙන්නෙත් නෑ. කවදාකවත් මේ මාර්ග ඵල ධර්ම අවබෝධ කරගන්නේ නෑ.

මේ **අනුලෝම ක්ෂාන්තිය** කියලා කියන්නේ ඥානයට කියන නමක්. **සම්මත්ත නියාමය** කියලා කියන එකත් ඥානයට කියන නමක්. **සෝතාපත්ති ඵලය** කියලා කියන්නෙත් ඥානයට කියන නමක්. මේ කිව්වේ ඥාන තුනක්. ධර්මයන් දිහා බලන බැලිල්ලට අනුව තමයි ඥානයට නම වැටෙන්නේ.

ඊළඟට තිබෙනවා

| |
|---|
| '''සො වත, භික්ඛවෙ, භික්ඛු සබ්බසඞ්ඛාරං අනිච්චතො සමනුපස්සන්තො අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො භවිස්සතී'ති ඨානමෙතං විජ්ජති. 'අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො සම්මත්තනියාමං ඔක්කමිස්සතී'ති ඨානමෙතං විජ්ජති. 'සම්මත්තනියාමං ඔක්කමමානො සොතාපත්තිඵලං වා සකදාගාමිඵලං වා අනාගාමිඵලං වා අරහත්තං වා සච්ඡිකරිස්සතී'ති ඨානමෙතං විජ්ජතී''ති. |

**සො වත, භික්ඛවෙ, භික්ඛු සබ්බසඞ්ඛාරං අනිච්චතො සමනුපස්සන්තො අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො භවිස්සතී'ති ඨානමෙතං විජ්ජති** = මහණෙනි භික්ෂුන් වහන්සේ නමක් සියලුම සංස්කාර ධර්මයෝ අනිත්‍ය වශයෙන් බලනවා. එලෙස අනිත්‍ය වශයෙන් බැලීම නිසා අනුලෝමික ක්‍ෂාන්තියට පත්වෙනවා.

අනුලෝම ක්‍ෂාන්තිය ඇති උනාට පස්සේ තමයි සම්මත්ත නියාමයට බැස ගන්නේ. සම්මත්ත නියාමයට බැස ගත්තට පස්සේ තමයි සෝවාන් වෙන්නේ. මේකේ සරල තේරුම තමයි කිසිම දවසක කිසිම කෙනෙකුට ධර්මයෝ අනිත්‍ය වශයෙන් බලන්නේ නැතුව සෝවාන් වෙන්න බෑ.

වෙනත් ආගම් වල ඉන්න අය භාවනා කළාට සෝවාන් වෙන්න බැරි ඒ අය නිත්‍යත්වය අතහරින්නේ නැති නිසා. අපි කියනවා 'ඒ අය අපිට වඩා බෞද්ධ, අපිට වඩා ධර්මය තිබෙනවා' කියලා. කවුරුවත් කරදර කරන්නේ නැතුව ඉන්න කොට අපි එහෙම කියනවා. අපි දන්නේ නෑ එයා එහෙම ඉන්න හේතුව. මේක ඒ මනුස්සයා පහත් කරන්නවත් අපි උසස් කරන්නවත් කියන එකක් නොවෙයි. අපි යම් යම් නිගමන වලට යනවා. එහෙම නිගමන වලට යන්න හොඳ නෑ.

මේ කරුණුටික දැනගැනීම මේ පින්වතුන්ට ඉතාමත් වැදගත්.

<u>විදර්ශනා භාවනාව පිළිබඳ ප්‍රශ්නයක්</u>

<u>පිළිතුර</u> - අපි පුරුදු වෙලා තිබෙනවා ඇතුලාන්තය බලන්නේ නැතුව පිට ලෝකය දිහා බලන්න. ඒක විදර්ශනාවෙන් බැලීමක් නොවෙයි. ඒක නිකං පෘථජ්ජන මට්ටමෙන් සුරංගනාලෝක හදාගෙන ලෝකය දිහා බැලීමක්. අපි යම් යම් තැන් වලට travel කරනවා. ඒ කොහේ හරි දුර පළාතකට යන්න ඕනෑ කියලා එහෙම යන්නේ මෙතැන නැති සැපයක් ඒ පැත්තේ ඇති කියන ලෞකික හැඟීම මත. 'මට මෙතැන අත් විඳින්න නැති දෙයක් තව තැනක ඇති' කියලා හැමවෙලේම බාහිරේට හිත ගිහිල්ලා තමයි තිබෙන්නේ. අනිත් එක තමයි අපිට බාහිරයෙන් ආටෝප සාටෝප අලංකාර විසිතුරු වෙන්න ඕනෑ කියලා එහෙම එකක් තිබෙනවා. ඒකෙන් මම කිව්වේ අපි හිත ඇතුලාන්තයට හරවන්නේ නැතුව ලෞකික මට්ටමෙන් පිටට හිත හරවපු එකක් තමයි අපි හැම එක්කෙනාටම තිබෙන්නේ. හිත පිටට හරවනකොට හැම වෙලේම අගය වැටෙන්නේ පිටට. අපි ඒවාට සංකල්පනාත්මකව අගයක් දෙනවා. අභයක් දීල ඒවා evaluate කර කර අපි එතැනට ළං වෙන්න මහන්සි ගන්නවා. එතකොට අපි අසරණ වෙනවා. නමුත් ලෞකික මට්ටමෙන් එහෙම හිතීමක් කරන්නේ නැතුව වටපිටාවේ තිබෙන කථාව අයින් කරලා බාහිරයට හිත යොමුකරන්නේ නැතුව ඇතුලත වෙන දේ බලන්න අවශ්‍යයයි.

<u>ප්‍රශ්නයක්</u> - ස්වාමීන්වහන්ස මුලදී විදර්ශනාව පටන් ගන්නකොට බාහිරයෙන් පටන් අරගෙන පස්සේ ධර්මතාවයක් හැටියට බලනවද?

<u>පිළිතුර</u> - අපි ලෞකික ජීවිතයකදී වට පිටාවේ තිබෙන දේවල් වලට බොරුවට කොච්චර මායාකාරී සංකල්පනා දීලා වහ වැටිලා යනවද. අපි හැම වෙලේම මහන්සි ගන්නේ බාහිර දේකටමයි. අපි ආධ්‍යාත්මයේ මගේ හිතට සිද්ධවෙන දේ ගැන හිතන්න පෙළඹෙන්නේ නැ. බුදුරජාණන්වහන්සේගේ දේශනාවේ තිබෙන්නේම බාහිරය අතහැරලා දාල තමා දෙස බලන්න කියලා. ඒ කාරණයයි මම උදේ කිව්වේ. නමුත් විදර්ශනා ඥාන වලට යනකොට ඒක දියුණු අවස්ථාවක්. එතකොට පුළුවන් බාහිරයයි ඇතුලාන්තයයි ඕලාරිකදේයි සියුම්දේයි හැම එකක්ම බලන්න. ඒක උසස් තැනක්. ඒ ඥානයෙන් හතර වටෙම් හසුරුවන්න පුලුවන්.

දැන් මේ ගැන හොඳට හිතන්න. පළවෙනි රහතන්වහන්සේලා 60 නම තමයි පස්වග මහණුන් වහන්සේලා, යසකුල පුත්‍රයා සහ ඔහුගේ යහළුවන් 54 දෙනා. පළවෙනි සතියේ මාර්ග ඵල ධර්ම අවබෝධ කරගත් පිරිස තමයි මේ. බුදුරජාණන්වහන්සේ දවස් 5 ක් පස්වහ මහණුන්වහන්සේලාට බණ දේශනා කරනවා. දවස් 5 ක් බණ දේශනා කරලා සෝවාන් මාර්ග ඵල වලට පත්කරලා පස්වෙනි දවසේ තමයි හම්බවෙන්නේ යසකුල පුත්‍රයා. ඊට පස්සේ සියලුම දෙනා වහන්සේලා රහත් භාවයට පත්කරනවා. සතියක් යනකොට රහතන්වහන්සේලා 61 නමයි බුදුරජාණන් වහන්සේත් සමග.

ඊට පස්සේ බුදුරජාණන්වහන්සේ ඒ මාස තුන එහෙ වැඩ ඉඳලා උන්වහන්සේ වෙන තැනකට වඩිනවා. ඒ රහතන්වහන්සේලා 60 නමට නියමයක් කළා ‘එක පාරක යන්න එපා, විවිධ පාරවල් වල තනි තනියෙන් ගිහිල්ලා මේ ආර්ය ධර්මය ලෝකයාට කියලා දෙන්න’ කියලා. ඒ හැට නමම පිටත් කරලා බුදුරජාණන් වහන්සේ වැඩම කළා උරුවේලාවට. බුදුරජාණන් වහන්සේ මාස තුනකට කලියෙන් ඒ පැත්තේ ඉඳලා තමයි වැඩම කළේ. බුදුරජාණන් වහන්සේ ගයා ශිර්ෂයේදී බුද්ධත්වයට පත්වෙලා බුද්ධගයාවේ ඉඳලා තමයි බරණැසට වඩින්නේ ධර්මය දේශනා කරන්න. ඒ, මාස තුනකට කලින් ඇසළ මස පුර පසළොස්වක පොහොයට ළං වෙන්න. බුදුරජාණන්වහන්සේ මාස තුනක් බරණැස වැඩ ඉඳලා ධර්මය දේශනා කරලා රහතන් වහන්සේලා 60 නමක් බිහිකරලා උවහන්සේ ආපසු වඩිනවා උරුවේලාවට.

බුදුරජාණන්වහන්සේ උරුවේලාවට වඩින්නේ එහෙ ඉන්නවා විසාල පිරිසක්. ඒ තමයි උරුවෙල කාශ්‍යප - නදී කාශ්‍යප - ගයා කාශ්‍යප කියලා සහෝදරයෝ තුන්දෙනෙක් සහ ඒ අයගේ විසාල පිරිස. උන්වහන්සේ ඒ පැත්තට වඩිනකොට මගදී හම්බවෙනවා තවත් පිරිසක්. ඒ තමයි කොසොල් රජ්ජුරුවන්ට හිටියා එක තාත්තගේ වෙනස් අම්මලාගේ සහෝදරයෝ 30 දෙනෙක්. කොසොල් රජ්ජුරුවන්ගේ නම ප්‍රසන්න ජිත් කෝසල. ඒ නම තමයි අපි සිංහලෙන් පසේනදී කියලා කියන්නේ. අනිත් එක තමයි අපි කියන්නේ කොසොල් කියලා නමුත් හරිනම ‘කෝසල’. ඉතින් මේ රජ්ජුරුවන්ට හිටියා සහෝදරයෝ 30 දෙනෙක්. මේ 30 දෙනා එකට තමයි හැදෙන්නේ වැඩෙන්නේ. එක දවසක් මේ අයට park එකකට යන්න උනා සතුටු වෙන්න. මේ රාජ කුමාරවරු විවාහ වෙලා හිටියේ. නමුත් එක්කෙනෙක් විවාහ වෙලා හිටියේ නැ. මේ විවාහ වෙලා නැති එක්කෙනාට ඒ අයගේ රාජ මාළිගාවය එන්නා වූ එක ගණිකාවක් ලැස්ති කරගත්තා ඒ couples ටික සම්පූර්ණ කරගන්න. ඉතින් මේ අය හිටියා park එකක.

බුදුරජාණන්වහන්සේ උරුවේලාවට යනගමනේ මග තිබුණා කපු වනයක්. ඒකට කියන්නේ කප්පාසික වන සන්ධිය කියලා. මේ වෙලාවේ අර කුමාරවරු සතුටු වෙමින් සිටින අතරතුර ඒ සමග ආපු ගණිකාව ඒ අය ගලවලා තිබුණ රත්තරන් බඩු ආදී වටිනා දේවල් අරගෙන පැනලා ගියා. කුමාරවරු ඇවිල්ලා බලනකොට රාජකීය පළඳනාවල් නැ. ඒ අය සමග පැමිණි ගණිකාවත් නැති බව දැනගෙන ඇය සොයාගෙන යනකොට බුදුරජාණන්වහන්සේ වැඩ ඉන්නවා දැකලා ඒ අය හිතුවා ‘ශ්‍රමණයන් වහන්සේ නමක් සිටිනවා වාඩිවෙලා, අනිවාර්යෙන්ම මේ ශ්‍රමණයන් වහන්සේ නම් ඇය දකින්න ඇති’

කියන හිතින් යුක්තව මේ කුමාරවරු ගියා බුදුරජාණන්වහන්සේ ළඟට. ගිහිල්ලා ඇහුවා 'ස්වාමීන්වහන්ස අපේ භාණ්ඩ ටිකක් නැති වෙලා තිබෙනවා. අපි මේ ගැහැණු කෙනෙක් හොයනවා. මේ පැත්තෙන් ගැහැණු කෙනෙක් ගියාද' කියලා. එතකොට බුදුරජාණන්වහන්සේ මේ අයගෙන් ඇසුවා "ගැහැණු ගිය පැත්ත බලන එකද වටින්නේ නැත්නම් තමන් යන පාර බලන එකද වටින්නේ" කියලා. මේක හොඳ කථාවක් අපි හැමෝටම. ඒ තමයි අනිත් අනිත් අය ගිය තැන් බලන්නේ නැතුව අපි යන පාර බලාගන්න එක තමයි වටින්නේ.

බුදුරජාණන්වහන්සේගේ මේ කථාව ඒ අය සංසාරයේ පුරුදු කරලා තිබුණ ධර්ම බලයට ස්පර්ශ වීමක් වගේ දෙයක් උනා. ඒ වෙලාවේදී මේ අයට තේරුණා 'හැබැවටම කොහේවත් යන ගැහැණු කෙනෙක් ගැන බලන එකද හොඳ නැත්නම් අපි දෙස බලන එකද' කියලා. **ඒ වෙලාවේ බුදුරජාණන්වහන්සේ මේ අයගේ බාහිරයට යොමු වෙලා තිබුණ සිත ඇතුලාන්තයට හැරෙව්වා, "තමා තුල බලන්න, තමා දිහා බලන්න, තමා යන පාර බලන්න" කියලා.** ඒක තමයි බුදුරජාණන්වහන්සේ ඒ කුමාරවරුන්ට හදලා දුන්නේ.

ඉතින් මේ කථාවේ තිබෙන්නේ බුදුරජාණන්වහන්සේ දේශනා කළේ බාහිරය නොවෙයි අනිත් අයගේ සිද්ධි නොවෙයි, බලන්න තමන්ගේ සිද්ධිය, තමන්ගේ සිත, තමන්ගේ ප්‍රතිපදාව, තමන්ගේ මාර්ගය.

ඒ වෙලාවේම ඒ අය කුමාරියෝ සියලු දෙනාට ගෙදර යන්න කියලා ඒ කුමාරවරු සියලු දෙනා මහණ උනා. ඒහි භික්ඛු භාවයෙන් පැවිදි උනා. මේ අය බණ අහලා එවෙලේම සමහර අය සෝවාන් උනා සමහර අය සකෘදාගාමී උනා සමහර අය අනාගාමී බවට පත් උනා, නමුත් කිසි කෙනෙක් රහත් උනේ නෑ. මේ කියන්නාවූ කුමාරවරු 30 දෙනාම එදා ඉඳලාම පිණ්ඩපාතයෙන්ම ජීවත් වෙනවා. පාංශකුල චීවරම දරනවා, පූජා කරන සිවුරු පිළිගන්නේ නෑ. තුන් සිවුර පමණයි පාවිච්චි කරන්නේ. අතිරේක රෙදි කඩක් පාවිච්චි කරන්නේ නෑ. ගෙපිළිවලින් වඩිනවා. කුටිවල වාසය කරන්නේ නෑ, වනාන්තරයේම වාසය කරනවා.

මේ කියන්නා වූ සෝවාන් සකෘදාගාමී අනාගාමී ආදී මාර්ග ඵල ලබාගත් ස්වාමීන්වහන්සේලා 30 දෙනාම ධුතංග සමාදන් වෙලා **පාවා** කියන නුවරට වැඩම කළා. ඒ ස්වාමීන්වහන්සේලා පාවා නුවර අවුරුදු 20 වැඩ සිටියා. මේ ස්වාමීන්වහන්සේලා සෝවාන් ආදී මාර්ග ඵල ලබා ගන්නේ බුදුරජාණන්වහන්සේට අවුරුදු 35 දී. එතකොට ඒ වෙනවිට බුදුරජාණන්වහන්සේගේ වයස අවුරුදු 55 යි. ඒ කාලයේදී බුදුරජාණන් වැඩ හිටියේ සැවැත්නුවර. ඒ භික්ෂූන් වහන්සේලා කල්පනා කළා 'අපි අවුරුදු 20 කින් බුදුරජාණන්වහන්සේ දැකලා නෑ, ඒක නිසා දැන් අපි යමු තථාගතයන් වහන්සේ දකින්න' කියලා. ඒ භික්ෂූන් වහන්සේලා කල්පනා කළා 'බුදුරජාණන්වහන්සේ සැවැත්නුවර වැඩ ඉන්නවා එහෙදි වස් සමාදන් වෙමු' කියලා හරියටම ජූලි මාසයේ පුර පසළොස්වක පොහොයට වස් සමාදන් වෙන්න මේ ස්වාමීන්වහන්සේලා එනවා පාවා නුවර ඉඳලා සැවැත්නුවරට. ඒ එන අතරතුර වැස්සා. හොඳටම වැහලා වැහලා උන්වහන්සේලාට සැවැත්නුවරට එන්න බැරි උනා. උන් වහන්සේලා මගදී සාකේතයේදී වස් සමාදන් උනා. සාකේත නුවර වස් සමාදන් වෙලා මේ ස්වාමීන්වහන්සේලා හරි අපහසුවෙන් ඒ කාලේ වැඩ හිටියා. වස් අවසානයේ ඔක්තෝම්බර් මාසයේ පුර පසළොස්වක පොහොය දවසට පස්සේ දවසේ ඉතිරි ටික එනම් සාකේත නුවර ඉඳලා සැවැත්නුවරට වඩින අතරමගදී වැස්සා. වැස්ස නිසා මඩ වෙච්ච පාරවල් වල ඇවිල්ලා සිවුරුවල මඩ ඉහිලා බර වෙලා තිබුණා. ඒ තමයි බුදුරජාණන්වහන්සේ කඨින චීවරයක් අනුදැන වදාරපු දවස.

ඉතින් ඒ ස්වාමීන්වහන්සේලා බුදුරජාණන්වහන්සේ හමුවෙන්න ඇවිල්ලා වන්දනා කරලා ඉන්න කොට "කොහොමද පහසුවෙන් හිටියද" කියලා සුහද සාකච්ඡාවක් කරලා උන්වහන්සේලාගේ දුක

සැප බලලා අන්න ඒ වෙලාවේ තමයි බුදුරජාණන්වහන්සේ විනය ශික්ෂාපදයක් පැනෙව්වේ කඨින සිවුරක් පූජා කරන්න පුළුවන් කියලා.

ඒ ස්වාමීන්වහන්සේලාට ඉස්සර කිව්වේ බද්ධ වග්ගිය කුමාරවරු කියලා. ඒ කියන්නේ 'සැප සම්පත් තියෙන තරුණ අය' කියන එකයි. ඒ කුමාරවරු කොසොල් රජ්රුවන්ගේ සහෝදරයෝ. කොසොල් රජ්ජුරුවෝ ශ්‍රද්ධාවන්තයි හොඳයි නමුත් යම් යම් තැන් වලදී politics නිසා මෝඩ වැඩ කරලා තිබෙනවා. මිනිස්සු සතුටින් තියා ගන්න ඕනෑවෙන් එයා ඒ වගේ වැඩ කරලා තිබෙනවා. ටිකක් රැවටිලිත් තිබෙනවා, කපටි වැඩත් කරලා තිබෙනවා. කොසොල් රජ්ජුරුවන්ගේ ජීවිතේ හරි අමුතු දේවල් එයා කරලා තිබෙනවා. විසාඛාව tax ගැන කථා කරන්න ගියහම එළියට එන්නේ නැතුව හිටියා. ජේතවනාරාමය ගාවම නිගණ්ඨයන්ට ආරාමයක් හදන්න ගියා. මල්ලිකා දේවියට රැවටුනා. තවත් දවසක් රජ්ජුරුවෝ එයාගේ රහස් පොලීසියේ කට්ටිය නිගණ්ඨයෝ හැටියට වස්ත්‍ර නැතුව පූර්වාරාමයට අසලින් අචිරවතී නදිය පැත්තට යන්න ඇරියා. පූර්වාරාමයේ බුදුරජාණන්ගේ දණහිස ගාව බිම වාඩිවෙලා ඉන්න ගමන්ම අර නිගණ්ඨයෝ පැත්තට හැරිලා වැන්දා 'මේ තමයි රහතන්වහන්සේලා කියලා'. බුදුරජාණන්වහන්සේ ඒ වෙලාවේ 'රහතන්වහන්සේලා හඳුනා ගන්නේ ඔහොම නොවෙයි' කියලා බණකුත් දේශනා කරලා තිබෙනවා. ඔන්න ඔය වගේ කබල් වැඩත් කරලා තිබෙනවා කොසොල් රජ්ජුරුවෝ.

ඒවගේම බුදුරජාණන්වහන්සේට මේවා දකිනවා පේනවා, බුදුරජාණන්වහන්සේට කිසිදෙයක් හංගන්න බෑ කියන එක තේරුණේ නෑ එයාට. අනිත් එක තමයි බුදුරජාණන්වහන්සේට සේනාසනයක් හදලා පූජා කරන අවස්ථාවකදී ස්වාමීන්වහන්සේලා පිටත් කළා 'රජ්ජුරුවන්ට කියන්න ආරාම දෙකක් එක ළඟ තියෙනකොට එක එක රණ්ඩු සරුවල් හැදෙනවා, ඒක ස්වභාවයක් ඒක මග හරවන්න' කියලා. රජ්ජුරුවෝ එළියට ආවේ නෑ. ඔන්න ඔය වගේ වැඩත් කරලා තිබෙනවා.

හොඳයි සැම දෙනාටම ධර්ම අවබෝධය නිර්වාණ අවබෝධය වේවා කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු !



ඉහත සඳහන් ධර්ම දේශනාව
අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.